### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### <u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය</u>

සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින සහකාර සුරාබදු කොමසාරිස් තනතුරේ පුරප්පාඩු අටක් (08) ක් **සම්පූර්ණ කිරීම** සඳහා 2026.03.11 දිනට පහත **සුදුසුකම් සම්පූර්ණ කරන ලද සක්‍රිය සේවයේ** නියුතු සුරාබදු අධිකාරීවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **තනතුරට අදාළ වැටුප් ක්‍රමය:-**

   2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානයන්ට අනුව SL-1- 2025 වැටුප් ඛණ්ඩයට අදාල වැටුප් පරිමාණය එනම්, රු.82,150 – 10 X 2,400 – 8 X 2,940 – 17 X 3,900 – 195,970/- (මාසික) මෙම තනතුරට හිමි වන අතර එහි 08 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

2. **වයස් සීමාව:-** අදාළ නොවේ.

3. **සපුරාලිය යුතු සුදුසුකම්:-**

   I. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සුරාබදු අධිකාරී තනතුරෙහි අවම වශයෙන් වසර තුනක (03) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් **සම්පූර්ණ කර** තිබීම. ( රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/PRO/07/1767/2022 හා 2025.12.19 දිනැති ලිපියට අනුව )

   II. සුරාබදු අධිකාරී තනතුරෙහි ස්ථිර කර තිබීම.

   III. සුරාබදු අධිකාරී තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

   IV. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

   V. **අයදුම්පත් කැඳවීමේ අවසාන** දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

   VI. **අයදුම්පත් කැඳවීමේ අවසාන** දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ අවවාද කිරීමක් හැර විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම.

4. **උසස් කිරීමේ ක්‍රමය:-**

   ඉහත සුදුසුකම් සපුරන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් ලකුණු පටිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, එහිදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු වලට තෝරා ගනු ලැබේ.

සුරාබදු අධිකාරීවරුන්, සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීමට අදාළ යෝග්‍යතා ඇගයිමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු පරිපාටිය

| අනු අංකය | ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | එක් එක් ශීර්ෂය යටතේ ලබා දෙන උපරිම ලකුණු |
|---|---|---|
| 01 | **සේවා පළපුරුද්ද**<br>සුරාබදු අධිකාරී තනතුරෙහි වසර 03 ක සේවා කාලයෙන් පසු එළඹෙන සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50 | 50 |
| 02 | **කාර්ය සාධන ඇගයීම**<br>( පූර්වාසන්න වසර 05ක සේවා කාලය සඳහා )<br>I. විශිෂ්ඨ - ලකුණු 04<br>II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 03<br>III. සාමාන්‍ය - ලකුණු 02 | 20 |
| 03 | **උසස් අධ්‍යාපන සුදුසුකම්**<br>I. නීතිය<br>II. කළමනාකරණය,ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලන හා මානව සම්පත් කළමනාකරණය,<br>III. ආර්ථික විද්‍යාව හා බදුකරණය,<br>IV. මූල්‍ය කටයුතු හා ගිණුම්කරණය,<br>V. ගණිතය හා සංඛ්‍යානය,<br>VI. පරිගණක විද්‍යාව හා තොරතුරු තාක්ෂණය,<br>VII. සමාජ විද්‍යාව හා අපරාධ විද්‍යාව ,<br>VIII. මනෝවිද්‍යාව හා උපදේශනය,<br>IX. මත්පැන් , මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය,<br>X. සැපයුම් කළමනාකරණය ( Logistic Management )<br>XI. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව,<br>XII. ජීව විද්‍යාව හා ආහාර විද්‍යාව,<br>XIII. භාෂාව,<br>XIV. අවධානම් කළමනාකරණය,<br>යන ක්ෂේත්‍රයන්ට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිලිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br>I. පශ්චාත් උපාධියක් සඳහා - ලකුණු 10<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05<br>(මාස 6ක් හෝ පැය 1500 කට නොඅඩු)<br>සැ.යු.<br>• උපරිම ලකුණු ලබා දිය හැකි එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>• දැනටමත් සුරාබදු දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉමක් ලෙස හෝ උසස් කිරීමක් සඳහා වූ සුදුසුකමක් ලෙස සලකා බලා ඇති සුදුසුකමකට ලකුණු හිමි නොවේ.<br>• උපාධි සහතිකයට අදාළ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනද ඉදිරිපත් කළ යුතුය. | 10 |
| 04 | **වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු**<br>දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු වලට අදාලව ලබා ඇති එක් පුහුණු සහතිකයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05කි.<br>සැ.යු.-<br>• පුහුණු කාලය සතියකට වඩා වැඩි පුහුණු සහතික පමණක් සලකා බලනු ලැබේ.<br>• මින් පෙර උසස්වීමකදී ලකුණු ලබා දෙන ලද වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු සහතික සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 05 |

| | | |
|---|---|---|
| 05 | **ප්‍රශංසා**<br>මෙම දෙපාර්තමේන්තුවට අදාල රාජකාරි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අදාල අමාත්‍යාංශ ලේකම් වෙතින් පොදු 230B ආකෘතිය අනුව ලබා ගත් එක් ප්‍රශංසාවකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10කි. | 10 |
| 06 | **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම**<br>• පෞරුෂත්වය ලකුණු 02<br>• සන්නිවේදන හැකියාව ලකුණු 02<br>• නායකත්ව කුසලතා ලකුණු 01 | 05 |
| | **මුළු ලකුණු** | 100 |

සටහන - ඉහත සියලු සුදුසුකම් තහවුරු කිරීම සඳහා අදාළ සහතික පත්‍ර/ ලේඛන ඉදිරිපත් කළ යුතුය.

5. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

- මෙම තනතුරට **උසස්වීම ක්‍රියාත්මක වන දිනය ලෙස සලකනුයේ, සම්මුඛ පරීක්ෂණය** පැවැත්වෙන **අවසාන දිනය වේ.**
- සම්මුඛ පරීක්ෂණ දිනට සක්‍රිය සේවයේ සිටින නිලධාරීන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- **දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.**

6. **අයදුම්පත් යොමු කිරීම :-**

- සුදුසුකම් ඇති තම තනතුරෙහි ස්ථිර කරනු ලැබුවාවූ සුරාබදු අධිකාරීවරුන් තමාගේ අයදුම්පත් මීට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය මඟින් අදාළ තහවුරු කිරීමේ ලිපිලේඛන සහිතව 2026.03.11...... දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **හෝ අතින්** ගෙනවිත් භාරදිය යුතුය.
- අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " සහකාර සුරාබදු කොමසාරිස් තනතුර " යනුවෙන් පැහැදිලිවම සටහන් කළ යුතුය.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය.

8. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලැබේ.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,**

ඩී.එච්.එස්. පුල්ලෙපෙරුම
අතිරේක ලේකම්
මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍යාංශය

**ලේකම්,**
**මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.**
දිනය - 2026.02.27

අයදුම්පත් අංකය:-.................................................

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය**

**I. කොටස (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීමට)**

01. නිලධාරියාගේ නම -......................................................................................................................

02. ලිපිනය -

I. කාර්යාලීය :-
......................................................................................................................

II. පෞද්ගලික :-
......................................................................................................................

III. ස්ථිර පදිංචිය :-
......................................................................................................................

03.

I. උපන්දිනය :-..........................................................................................................

II. ජාතික හැඳුනුම්පත් අංකය :-.........................................................................................

04.

(අ) මුල් පත්වීමේ :-

I. තනතුර -..........................................................................................

II. පත්වීමේ දිනය -..........................................................................................

III. සේවයේ ස්ථිර කළ දිනය -..........................................................................................

(ආ) සහකාර සුරාබදු කොමසාරිස් තනතුර පිළිබඳ තොරතුරු :-

I. එම තනතුරට පත් වූ දිනය -..........................................................................................

II. ස්ථිර කල දිනය -..........................................................................................

III. සේවා කාලය -..........................................................................................

05. සුරාබදු අධිකාරීවරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය,

සමත් වී තිබේද?.................................................... සමත් වූ දිනය -....................................................

06. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුල ඔබ :

I. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..............................................................
(නැත්නම් විස්තර කරන්න)

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව ඔබ විනයානුකූල දඬුවම් ලබා තිබේද?

......................................................................................................................

......................................................................................................................

07. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබේද?

......................................................................................................................

08. (අ) ඔබ ලබා ඇති ප්‍රශංසා හා විශිෂ්ඨ සේවා සහතික

I. ......................................................................................................................

II. ......................................................................................................................

III. ......................................................................................................................

(ආ) අදාල වෙනත් සුදුසුකම් ( තහවුරු කිරීම සඳහා ඡායාපිටපත් ඉදිරිපත් කරන්න.)

I. ..........................................................................................................................................

II. ..........................................................................................................................................

III. ..........................................................................................................................................

09. ඔබ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා ශාරීරික යෝග්‍ය තත්වයක සිටින්නේදැයි සඳහන් කරන්න:-

..........................................................................................................................................

ඉහත සපයා ඇති විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි.

මා මෙම තනතුර සඳහා තෝරාගත හොත් සුරාබදු ආඥා පනතේ නීති රෙගුලාසි වලට අමතරව රාජ්‍ය සේවාවේ පොදු කොන්දේසිවලට එකඟව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පිරිනමනු ලබන දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය සඳහා යාමට කැමති බවත් සහතික කර ප්‍රකාශ කරමි.

.............................................

අයදුම්කරුගේ අත්සන

දිනය 2026.01.

**II කොටස** - දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

......................................................

සුරාබදු කොමසාරිස් / අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් / සුරාබදු කොමසාරිස් ජනරාල්

දිනය : 2026.

**III කොටස** - අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

1. සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරී ................................ මහතා රාජකාරී හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ එකඟ වෙමි/ එකඟ නොවෙමි.
2. නිලධාරියාගේ රාජකාරී, හැසිරීම, විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කළෙමි. ................................ මහතා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම නිර්දේශ කරමි./ නොකරමි.

   නිර්දේශ නොකරන්නේ නම් එයට හේතුව,

   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ......................................................................

3. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතද, අදාළ ලේඛනවල සහතික කළ පිටපත්ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.

.....................
දිනය

.................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
නිල මුද්‍රාව

*අදාළ නොවන වචන කපා හරින්න.